**කොලොන්න ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 13 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 21 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කොලොන්න ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු එකතුව රු. 10,080 ක් වූ පුස්තකාල පොත් 18 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙන් තොරව එකතුව රු. 150,492 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම් වලින් ඉවත් කිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2016 වර්ෂය තුලදී මිලදීගෙන තිබූ පාරිභෝජ්‍ය ද්‍රව්‍යයන් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් රු. 11,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් ශේෂ දෙකක පැවති දෝෂ සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමකින් තොරව ඉදිරියට ගෙනවිත් තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම වගකීම් රු. 147,300 කින් වැඩියෙන් දැක්වුණි.

(ඉ) එකතුව රු. 24,500 ක් වූ විවිධ තැන්පතු ගෙවීම් ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තු යටතේ ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදල හා ඌනතා ගිණුමේ සටහන් කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල රු. 24,500 කින් අඩුවෙන් දැක්වුණි.

(ඊ) එකතුව රු. 96,630 ක් වූ කර්මාන්ත තැන්පතු වලින් ගෙවීම්, ප්‍රාග්ධන වැය යටතේ ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කිරීමේ දී සමුච්චිත අරමුදල හා ඌනතා ගිණුමේ සටහන් කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල රු. 96,630 ක් අඩුවෙන් නිරූපණය විය.

(උ) 2016 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ශේෂය රු. 261,354 කින් හා තැන්පතු ගිණුම් 04 ක ශේෂයන්හි එකතුව රු. 1,219,198 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

-----------------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) මුදල් රෙගුලාසි 371 | 1998 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල ගෙවීම් කරන ලද එකතුව රු. 83,310 ක් වූ අත්තිකාරම් 02 ක් 2017 ජූලි වනවිටත් පියවා නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) මුදල් රෙගුලාසි 571 | 2016 දෙසැම්බර් 31 දිනට වසර 02 ක කාලයක් ඉක්මවූ එකතුව රු. 387,260 ක් වූ කල්ඉකුත් වූ තැන්පතු 64 ක් සම්බන්ධයෙන් 2017 ජූලි වනවිටත් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 2,237,150 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 12,838,482 ක් වූ බැවින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 10,601,332 ක අඩුවීමක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

මූල්‍ය ප්‍රතිඵලය රු. 10,601,332 කින් අඩුවීම කෙරෙහි ආදායම් විෂයයන් 02 ක රු. 10,362,217 කින් අඩුවීම හා වියදම් විෂයයන් 03 ක රු. 1,247,759 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

---------------------

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| | 000' | 000' | 000' |
| වරිපනම් හා බදු | 857 | 887 | 342 |

| | | | |
|---|---|---|---|
| බදු කුලී | 5,736 | 3,605 | 5 |
| බලපත්‍ර ගාස්තු | 647 | 936 | - |
| වෙනත් ආදායම් | 29,379 | 19,807 | 8,695 |

**2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 45 හා සියයට 16 කින් වැඩි වී තිබූ අතර බදුකුලී ආදායම, වරෙන්තු හා දඩ හා රජයේ දායකත්වය යටතේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 37, සියයට 36 හා සියයට 45 කින් අඩුවී තිබුණි.

**2.3.3 බලපත්‍ර ගාස්තු**

----------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් පරිදි පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර යටතට ගැනෙන ආයතන 05 ක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

**2.3.4 වෙනත් ආදායම්**

-------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015 දෙසැම්බර් 11 දිනැති අංක 1945 දරන ගැසට් පත්‍රයට අනුව ඉටිරෙදි හෝ රෙදි වලින් නිමකල ප්‍රචාරණ දැන්වීම් සඳහා ගාස්තු අයකිරීම ප්‍රකාශයට පත්කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ ප්‍රදර්ශනය කර තිබුණු කිසිඳු ප්‍රචාරණ දැන්වීමකින් ගාස්තු අයකර නොතිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පහත කරුණු කිරික්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ජුනි සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලැබිය යුතු උසාවි දඩ රු. 1,145,910 ක් 2017 ජූලි වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) 2015 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට හා 2016 වර්ෂයට අදාලව ඇඹිලිපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 4,982,959 ක් 2017 ජූලි වනවිටත් අයකර ගෙන නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්යසාධනය**

-----------------

2016 වාර්ෂික අයවැය ලේඛනය තුල සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කර්මාන්ත හඳුනාගෙන නොතිබුණු අතර, ප්‍රාදේශීය සභා අරමුදල් යටතේ රු. 1,000,000 ක් සහ පළාත් සභා හා වෙනත් අරමුදල් යටතේ රු. 6,000,000 ක් වශයෙන් එකතුව රු. 7,000,000 ක් සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රාදේශීය සභා අරමුදල් යටතේ කර්මාන්ත 08 ක් වෙනුවෙන් රු. 3,912,398 ක් හා පළාත් සභා අරමුදල් යටතේ කර්මාන්ත 56 ක් වෙනුවෙන් රු. 54,089,279 ක් වශයෙන් එකතුව රු. 58,001,677 ක් වැයකර තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු ගම් නම්කිරීම හා ඊට අදාල කටයුතු කිරීම සඳහා 2014 අගෝස්තු 26 දින සභා තීරණයක් ගෙන තිබුණු අතර, 2016 අගෝස්තු 31 දින වනවිටත් දියුණු ගම් නම්කිරීම සිදුකර නොතිබුණු අතර, එම කාර්යය වසර 02 කින් ප්‍රමාද වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පුස්තකාල වල ළමා අංශ ඇති කිරීම හා පුස්තකාල සඳහා පරිගණක ඒකක ඇති කිරීම සැලසුම් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුලදී එම කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.

## 3.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

2017 ජූලි වනවිට අළුත්වැඩියා හෝ අපහරණය කලයුතු තත්ත්වයේ පැවති එකතුව රු. 6,136,550 ක් වූ යන්ත්‍ර හා වාහන 05 ක් මාස 07 සිට වර්ෂ 08 ක කාලයක් තිස්සේ අළුත්වැඩියා හෝ අපහරණය කිරීමකින් තොරව පැවතුණි.

## 3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභාව විසින් එකතු කරන නොදිරන කසල වෙන්කර විධිමත් පරිදි බැහැර කරන තෙක් බාහිර ආයතනයකට අයත් පැරණි ගොඩනැගිල්ලක ගබඩා කර තිබුණි. 2017 ජූලි වනවිට එම ගොඩනැගිල්ල නොදිරන කසල වලින් පිරී පැවති අතර, එම කසල විධිමත් පරිදි බැහැර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛණයෙන් වැය විෂයයන් 90 ක් සඳහා සැලසූ එකතුව රු. 42,690,300 ක් වූ මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණු අතර වැය විෂයයන් 09 ක් සඳහා සැලසූ එකතුව රු. 886,920 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 85 සිට සියයට 98 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

## 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

## 4.4 අභ්‍යන්තර විගණනය

------------------------

සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණනය සිදුකිරීම සඳහා විෂයයභාර නිලධාරියෙකුට වැඩ පැවරීමක් සිදුකර අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, එම ඒකකය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ගිණුම් වලින් අත්හැරීම් තිබීම |
| | | (ii) | ලෙජර් ගිණුම් හා උපයෝගී ලේඛන නොසැසඳීම |
| | | (iii) | ආදායම් අඩුවෙන් සටහන් කිරීම |
| | | (iv) | වත්කම් අඩුවෙන් සටහන් කිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | වත්කම් පාලනය | | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවතීම |
| (ඈ) | අයවැය පාලනය | | ප්‍රතිපාදන ඉතිරිවීම |
| (ඉ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | විධිමත් ලෙස බැහැර නොකිරීම |